# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2021 අංක 25 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2021 ඔක්තෝබර් මස 26 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2021 ඔක්තෝබර් මස 29 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

මිල : රු. 5.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2021 අංක 25 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත

(සහතිකය සටහන් කළේ 2021 ඔක්තෝබර් මස 26 වන දින)

එල්.ඩී.—ඕ. 12/2021

### (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2021 අංක 25 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය

2. (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 53 වන වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:- — 19 වන අධිකාරයේ 53 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

"වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තන්ට මරණීය දණ්ඩනය වෙනුවට රඳවා තැබීමේ දණ්ඩනය නියම කිරීම

53. (1) යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන අවස්ථාවේ දී ඒ තැනැත්තාගේ වයස අවුරුදු දහඅටට අඩු නම්, ඒ තැනැත්තාට එරෙහිව මරණීය දණ්ඩනය ප්‍රකාශයට පත් කිරීම හෝ වාර්තාගත කිරීම නොකළ යුතු ය.

(2) අධිකරණය විසින්, එවැනි තැනැත්තකු සඳහා මරණීය දණ්ඩනය නියම කිරීම වෙනුවට, වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තන් රඳවා තැබීම සඳහා යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවා ඇති යම් ආයතනයක, දණ්ඩනයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාවක් සඳහා රඳවා තැබීමේ දණ්ඩනයක් එම ලිඛිත නීතියේ විධිවිධානවලට යටත්ව, නියම කරනු ලැබිය යුතු ය.".

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. — අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.